3. සියළුම බන්ධනාගාර සිර කඳවුරු හා චරිත ශෝධනාගාර වල රැඳවියන් සඳහා කාර්මික, කෘෂිකාර්මික, සත්ව පාලනය හා වෘත්තීය පුහුණුව ලබා දීම.

4. බන්ධනාගාර සිර කඳවුරු හා චරිත ශෝධනාගාර සඳහා සුභසාධක සේවා සැපයීම

5. විශෝධන ක්ෂේත්‍රය සවිමත් කිරීමට අවශ්‍ය පුහුණු කිරීම් සඳහා විධිවිධාන සැලසීම

6. කාලීන අවශ්‍යතාවට ගැළපෙන පරිදි රැඳවියන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස පිටත් වීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසීම

7. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අදාලව බන්ධනාගාර තදබදය අවම කිරීම, නවීන තාක්ෂණය හඳුන්වා දීම, භෞතික සම්පත් වැඩිදියුණු කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය.

8. සේවා අංශයන්ට අදාළ පුහුණු හා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම තුළින් මනා පරිචයකින් හා සේවා තෘප්තියකින් යුත් නිලධාරීන් බිහි කිරීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය

9. රැඳවි පරිපාලන කටයුතු වඩාත් විධිමත්ව හා කාර්යක්ෂමව ඉටු කිරීම උදෙසා රැඳවියන්ගේ තොරතුරු කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීම.

**ප්‍රමුඛතා**

බන්ධනාගාර ගත වන්නන්ට ආරක්ෂාව සැපයීම, රැකවරණය ලබාදීම හා පුනරුත්ථාපනය කිරීම

### 4.6.2 <u>2022.01.01 – 2022.09.30 දක්වා රැඳවි පරිපාලන තොරතුරු</u>

**1. උසාවි මඟින් කෙළින්ම ඇතුලත් වූ රැඳවි සංඛ්‍යාව - (2022.01.01 – 2022.08.31)**

| කෙළින්ම ඇතුලත් වූ රැඳවි සංඛ්‍යාව | පිරිමි | කාන්තා | එකතුව |
|---|---|---|---|
| උසාවි මඟින් බන්ධනාගාර ගත කරන ලද සිර සංඛ්‍යාව | 14,734 | 207 | 14,941 |
| උසාවි මඟින් බන්ධනාගාර ගත කරන ලද සැක සංඛ්‍යාව | 59,947 | 2,221 | 62,168 |
| **එකතුව** | **74,681** | **2,428** | **77,109** |

**2. 2022.09.30 වන දින අලුයම විවෘතයට අනුව රැඳවි සංඛ්‍යාව**

| සමස්ථ රැඳවි සංඛ්‍යාව | පිරිමි | කාන්තා | එකතුව |
|---|---|---|---|
| සියළුම සිරකරුවන් | 8,810 | 192 | **9,002** |
| සියළුම සැකකරුවන් | 14,993 | 658 | **15.651** |
| **මුළු එකතුව** | **23,803** | **850** | **24,653** |

**3. රැඳවුම් භාරයේ සිට පැනගිය / මිදී ගිය සිර හා සැක සංඛ්‍යාව (2022.01.01 – 2022.09.30)**

- අත්අඩංගුවෙන් පැන ගිය/ මිදී ගිය සිර හා සැක කරුවන් සංඛ්‍යාව - 188
- නැවත අත්අඩංගුවට පත් සංඛ්‍යාව - 84